**1989 අංක 05 දරණ හදිසි අවස්ථා**

**අරමුදල ප්‍රඥප්තිය**

# Contingencies Funds Statute

1989 අංක 42 දරණ පළාත් සභා පනතේ 20 (1) වගන්තිය යටතේ හදිසි අවස්ථා අරමුදලක් පිහිටුවීම පිණිස ද ඊට සම්බන්ධ සහ අනුෂංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීම පිණිසද වූ ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1988 අංක 5 දරණ හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඩු නාමය

2. (1) බස්නාහිර පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුනින් (මෙහි මින් මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන) හදිසි අවස්ථා අරමුදලක් මෙයින් ඇති කර ලැබේ. පළාතේ හදිසි අවස්ථා අරමුදල

(2) රුපියල් දශලක්ෂ එකක මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදලට බැර කළ යුතු අතර එම මුදල අරමුදලේ කොටසක් විය යුතුය.

(3) පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රඥප්ති මගින් කලින් කලට තීරණය කෙරෙන සියලු මුදල් මෙම අරමුදලට බැර කළ යුතුය.

3. අරමුදලෙන් අත්තිකාරම් ගෙවීමේදී 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20 (2) අරමුදලෙන් අත්තිකාරම්

උප වගන්තියේ දැක්වෙන විධි විධාන අනුගමනය කළ යුතුය.

ගෙවීම 20(2) වගන්තිය අනුව විය යුතුය.

මෙම ප්‍රඥප්තිය 1989 ඔක්තෝබර් 11 වන දින බස්නාහිර පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.